# රමණී ලියනාරච්චි මහත්මිය වෙනුවෙන් අනුරාධපුර රෝහලට ගිලන් රථයක්



මෙල්බන් ශ්‍රී ලාංකේය ප්‍රජාව වෙනුවෙන් අමිල සේවයක් කළ රමණී ලියනාරච්චි මැතිණිය සමරනු වස් අනුරාධපුර රෝහළට අත්‍යවශ්‍යව සිබූ ගිලන් රථයක් පසුගිය අප්‍රේල් 30 වන දින උත්සවාකාරයෙන් පරිත්‍යාග කෙරුණි. මේ සඳහා මූලිකත්වය ගත් ආචාර්ය කරු ලියනාරච්චි මහතා සමග අප කළ පිළිසඳරකි මේ.

**සන්නස**
අපි දන්නවා මේ සත් ක්‍රියාව වෙනුවෙන් ඔබ ඉතා වෙහෙසක් ගත් බව. මේ කාර්යය මේ තරම් සාර්ථක කරගන්නට හැකි වුණේ කොහොමද?
**කරු**
මේ කාර්යය සාර්ථක කරගන්නට මට ශක්තිය ලබා දුන් කීප දෙනෙක්ම ඉන්නවා. රමණී මේ සමාජයට කළ සේවය අගයන අති විශාල පිරිසක් මෙහි ඉන්නවා. ඒ



අයගේ ආශිර්වාදයත් මට ලැබුණා. මුලින්ම මම මතක් කරන්න ඕනෙ මේ අදහස අපේ පවුලේ අයට ඉදිරිපත් කළේ වෛද්‍ය රංජිත් හෙට්ටිආරච්චි මහතා සහ පුෂ්පා හෙට්ටිආරච්චි දෙපළයි. ඔවුන් තමයි මේ කටයුත්තට මූලිකත්වය ගෙන කටයුතු කළේ. ඇත්තෙන්ම අපේ පවුලේ අය කළේ මේ ගිලන් රිය ශ්‍රී ලංකාවට යැවීම සඳහා අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදන සම්පාදනය කරදීමයි.

මේ ගිලන් රථට අපට ලබා දුන්නේ ඔස්ට්‍රේලියා ක්වීන්ස්ලන්ත ගිලන් රථ සේවයයි. මේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ ජාතික රුධිර පාරවිලයන සේවයේ අධිපති දොස්තර ආනන්ද ගුණසේකර මහතා ශ්‍රී ලංකාවේ සිට සම්බන්ධීකරණය කළා. මේ ගිලන් රිය ශ්‍රී ලංකාවේ වරායෙන් ලබාගැනීම ඇතුලු කටයුතු සඳහා අවශ්‍ය




වියහියදම් සංවිධානය කළේ ඔවුන් විසිනුයි.

**සන්නස**
ඒ කියන්නේ මේ ව්‍යාපෘතිය දියත් කිරීමට ඕස්ට්‍රේලියාව සහ ශ්‍රී ලංකාව කියන දෙපාර්ශවයෙන්ම සහයෝගය ඔබට ලැබුණා..?
**කරු**
හරියටම හරි. හරියටම කියනවා නම් පාර්ශව තුනක් එක්ව දියත් කළ ව්‍යාපෘතියක්. ත්‍රිකෝණාකාර සම්බන්ධයක්. ගිලන් රිය ලබා ගැනීමට පුෂ්පා රංජිත් යුවලත් එය ශ්‍රී ලංකාවට යැවීමට මාත් දුව පූර්ණා සහ පුතා රොහාන් සහ ගිලන් රිය ශ්‍රී ලංකාවේ රෝහලට බාර දීමට වෛද්‍ය ආනන්ද ගුණසේකර යන් තුන් පාර්ශවයම එක්වුණා. මම මේ කාරණය වැඩියෙන් අවධානය කරන්නේ ඕස්ට්‍රේලියාවේ වෙසෙන අයට තමන්ට හැකි පමනින් සහයෝගය දක්වා මෙවැනි අත්‍යවශ්‍ය අංග වන ගිලන් රථ වැනි දෑ මේ රටෙන් ලබාගෙන ශ්‍රී ලංකාවට යවන්නට ඇති ඉඩ කඩ පිළිබඳ දැනුවත් කරන්නයි. ඒ ගැන කවුරු හෝ උනන්දු වෙනවා නම් වෛද්‍ය රංජිත් සහ පුෂ්පා යුව

ගෙන් සියලු විස්තර දැන ගත හ6ැකියි.

**සන්නස**
ඔබ රමණී ලියනාරච්චි මහත්මිය වෙනුවෙන් තවත් කාර්යයන් රැසක් කර තිබෙනවා නේද?
**කරු**
රමණී 2006 දෙසැම්බර් 8 වන දා අප අතරින් වෙන්ව ගියා. ඉන් පස්සෙ 2007 වසරේ නාරද හාමුදුරුවන් ගේ -නිසල දිවියක ඇත්ත නැත්ත" පොත Facts of Life මැයෙන් මවිසින් පරිවර්තනය කර ප්‍රකාශයට පත් කළා.

වෛද්‍ය ඉයන් ගෝලා ගේ You can Conquer



Cancer පොත ඩී බී කුරුප්පු මහතා "පිළිකා සුවය ඔබ අතමය" නමින් පරිවර්තනය කර තිබුණා. පළමුව දයා ජයසිංහ මහතා විසින් ප්‍රකාශයට පත් කර තිබුණත් පසු කාලයක මේ පොත සොයා ගන්නට නොහැකිව තිබුණා. 2008 වසරේදී රමණී වෙනුවෙන් මම මේ පොත නැවත ප්‍රකාශයට පත් කළා. "නිසල දිවියක ඇත්ත නැත්ත" හා "පිළිකා සුවය ඔබ අතමය" යන පොත් දෙකම මම බෙදා හැරියේ නොමිලයේ.

2009 වසරේ මම දරු දෙදෙනාත් සමග එකතුව මහරගම පිළිකා රෝහලට අත්‍යවශ්‍ය යන්ත්‍රයක් වන මෙමෝ ග්‍රැෆි ප්‍රොසෙසර් යන්ත්‍රයක් පරිත්‍යාග කළා. ගාල්ල කරා පිටිය රෝහලට හෘද රෝගීන්ට අත්‍යවශ්‍ය උපකරණයක් වන ටෙම්පරරි ෆේස් මේකර් යන්ත්‍රයක් ද පරිත්‍යාග කළා. ඒ සමගම -පිළිකා සුවය ඔබ අතමය" පොත්ද මේ රෝහල් වලට පරිත්‍යාග කළා. ගාල්ලේ මඩවල මුල්ලේ අසෝක මාවතේ සද්ධාතිස්සාරාමයේ දාන ශාලාව තනවා මහා සංඝයා වෙත පූජා කළා. මේ සියලු කාර්යයන්ට අමතරව තමයි ගිලන් රිය මේ වසරේ පරිත්‍යාග කළේ. ශ්‍රී ලංකාවේ පවත්වන ලද උත්සවයේදී මගේ සොහොයුරන් වන සූරතිස්ස සහ ජයතිස්ස සහ පවුලේ උදවිය කොළඹ දී මේ ගිලන් රථය බාර රජයට බාර දුන්නා.

ආචාර්ය කරු ලියනාරච්චි විසින් ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකේය ප්‍රජාව වෙනුවෙන් කරන ලද සේවය විශාලය. ඉතා නිහඬව ඔහු විසින් කරමින් සිටිනු ලබන මේ කාර්යයන් පිලිබඳව යම් තරමකින් හෝ අපේ සමාජය දැනුවත් විය යුතුයයි අපි සිතමු. ඔහුගේ මේ වෑයමින් මහඟු ඵල නෙලා ගන්නා ශ්‍රී ලාංකික ජනතාව සේම අපිද ඔහුට සුබ පතන්නේ තවත් කාලයක් මේ සත්කාර්යයන්හි යෙදෙන්නට ශක්තිය ලැබේවා කියායි.

ශ්‍රීනාත් මද්දුමගේ

TAX - TAX - TAX

Do you want
the maximum Tax Refund Quickly?

We prepare tax returns with
the lowest possible tax legally payable.

- Preparation & Lodgement of Tax Returns & Business Activity Statements
- GST Registration / Business name registration
- ABN & Tax File Number applications
- Bookkeeping

Dave Susith Balapitiya
CPA, MBA, BSc, MNIA, MAAT

WIZARD ACCOUNTING
Registered Tax agent & Professional Accountants

KEYSBOROUGH
Tel 03 9711 5743
Mobile 0433 58 49 68
31 Eildon Drive
Keysborough 3173
(Mel Ref 89 B8)

RESERVOIR
Tel 03 9402 2033
Mobile 0433 58 49 68
71 Marchant Ave
Reservoir 3073
(Mel Ref 18 J5)

Jagath JE - Sannasa

BAS SERVICE PROVIDER
- Preparation of Business Activity Statements
- GST Registration / Business name registration
- ABN & Tax File Number applications
- Bookkeeping

Priyantha Rathnayake
MBA BSc MNIA ASA

Mobile 0433 58 49 68
Tel 03 9402 2033
71 Marchant Ave
Reservoir 3073
(Mel Ref 18 J5)

WIZARD ACCOUNTING
Registered Tax agent & Professional Accountants